Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

| 8 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 40 | S | I,II |
|---|---|---|---|---|

නම: ............................................. **පෙරදිග සංගීතය** **කාලය පැය දෙකයි**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01) කාෆි රාගය ආශ්‍රිතව නිර්මාණය වී ඇති ස්වර ස්ථාපන ගීතය කුමක් ද?
   1. ඇහැල මහට ඇහැල ගහට    2. රන්වන් කරල් සැලෙයි
   3. සිරිසාර අතිශාන්ත    4. මල් පිබිදීගෙන එන්නේ

02) සරල ගීතයක පෙර වාදනය හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
   1. Chorus    2. Melody    3. Introduction    4. Interlude

03) දෙවියන්ගේ ගුණ ගායනය කෙරෙන ගීත විශේෂය කුමක් ද?
   1. නූර්ති ගීත    2. භජන් ගීත    3. ඛ්‍යාල් ගීත    4. රවීන්ද්‍ර ගීත

04) බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ දී යොදාගන්නා Semibreve (0) සංකේතයේ වටිනාකම ඇතුළත් පිළිතුර තෝරන්න.
   1. 1/2    2. 1    3. 2    4. 4

05) ''දවසක් පැල නැති හේනේ'' යන මව්ගුණ ගීතය ගායනය කරන ගායකයාගේ නම කුමක්ද?
   1. ගුණදාස කපුගේ මහතා    2. කරුණාරත්න දවුල්ගනේ මහතා
   3. වික්ටර් රත්නායක මහතා    4. ඩබ්.ඩී. අමරදේව මහතා

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට අදාළව දී ඇති (අ) තීරුවට ගැලපෙන නිවැරදි පිළිතුර (ආ) තීරුවෙන් තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

| අ | ආ | |
|---|---|---|
| 06) සාරංගි පවුලට අයත් තන්ත්‍රිය භාණ්ඩයකි | (a) සිතාරය | (.............) |
| 7) සුළං පිඹීම සඳහා සිදුරක් ඇති අතර, සෙසු සිදුරු විවෘත කිරීමෙන් හා වැසීමෙන් ස්වර නිපදවා ගන්නා සංගීත භාණ්ඩයකි. | (b) එස්රාජය | (.............) |
| 08) ප්‍රධාන තත 'නායකී තාර්' ලෙස හැඳින්වෙන සංගීත භාණ්ඩයකි | (c) සර්පිනාව | (.............) |
| 09) යතුරු පුවරුව සහිත සංගීත භාණ්ඩයකි | (d) වයලීනය | (.............) |
| 10) තත් 04 කින් යුත් තත් භාණ්ඩයකි | (e) බටනළාව | (.............) |

11) සියළුම ස්වර ශුද්ධව යෙදෙන සම්පූර්ණ ජාති රාගය කුමක් ද?
   1. බිලාවල්    2. යමන්    3. කාෆි    4. භූපාලි

12) අමීර් කුෂ්රු නම් සංගීතඥයා නිර්මාණය කළ තත් වාද්‍ය භාණ්ඩය කුමක් ද?
   1. ගිටාරය    2. සිතාරය    3. එස්රාජය    4. වයලීනය

13) ''සිරි සංඝබෝධි මාලිගාවේ දී'' යන ගීතය ඇතුළත් නූර්තිය කුමක් ද?
   1. කුණ්ඩලකේශී    2. දුටුගැමුණු    3. හේමමාලි    4. සිරිසඟබෝ

14) සිතාරයේ පර්දා නොමැති ස්වර යුගලය වන්නේ,
   1. ශුද්ධ ගාන්ධාරය හා කෝමල ධෛවතය ය    2. තීව්‍ර මධ්‍යමය හා ශුද්ධ පංචමය ය
   3. කෝමල රිෂභය හා කෝමල ධෛවතය ය    4. කෝමල රිෂභය හා තීව්‍ර මධ්‍යමය ය

15) ''කොබෝ කුරුළුවනේ'' යන ගී පාදයේ සැඳැස්මත් ගණන කීයද?
   1. 7    2. 9    3. 10    4. 12

• අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට දී ඇති ගී පද ප්‍රස්තාර වල රිද්ම රටාවට ගැලපෙන දේශිය තිත් රූපය පහත දී ඇති වරහන තුලින් තෝරා, ප්‍රශ්න අංකය ඉදිරියේ ලියා දක්වන්න.

**(මැදුම් තනිතිත, මහතනිතිත, සුළු මැදුම් දෙතිත, සුළු මහදෙතිත, මැදුම් මහදෙතිත, සුළු තනිතිත)**

16) / සත් / වෙත්ම / හත් / අදර /

17) / උද s / ය ට s / පා s s / ය න s /

18) / තෙ ම් s / තෙ s නෙ s / න ම් s / තෙ s නෙ s /

19) / දොඩම්ක / පා s ලා s / ඇඹුල්ත / නා s ලා s /

20) / සු රි / ඳුන් පෙර / සි s / වා s s න් /

## II කොටස

**• පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.**

01) පහතින් දක්වා ඇත්තේ ඔබ පන්ති කාමරයේ උගත් නිර්දේශිත රාග 03 ක ආරෝහණයන්ට අයත් ස්වර වේ.
A. සරිගමපධනිස්
B. සරිගුමපධනිස්
C. සරිගපධස්

i. ඉහතින් දක්වා ඇති රාග 03 හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමඟ ලියන්න. (ල. 03)
ii. ඉහත රාග 03 න් එක් රාගයකට අයත් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. ස්වර වලට (ල. 04) පද වලට (ල. 02) මුළු (ල. 06)
iii. ඔබ ප්‍රස්තාර කළ ගීතයට ගැලපෙන හින්දුස්ථානී තාලය නම් කරන්න. (ල. 01)

02) i. මාත්‍රා 10 ක් හා මාත්‍රා 14 ක් බැගින් යෙදෙන නිර්දේශිත හින්දුස්ථානී තාල යුගලය පිළිවෙලින් නම් කරන්න. (ල. 02)
ii. ඉහත හින්දුස්ථානී තාල දෙකෙන් එකක් ප්‍රස්තාර කරන්න. (තාලයේ නම ලියන්න) (ල. 06)
iii. ඉහත තාල දෙකට ගැලපෙන දේශීය තිත් රූප දෙක නම් කරන්න. (ල. 02)

03) පහත දී ඇති බටහිර සංගීත ප්‍රස්තාර කොටස ඇසුරින් පිළිතුරු සපයන්න.




i. ABCD යන අකුරු වලින් දක්වා ඇති ඉහත ස්වර ප්‍රස්ථාරයේ සංකේත ඉංග්‍රිසි අක්ෂරය ද සමඟ නම් කරන්න. (ල. 04)
ii. ඉහත බටහිර ස්වර ප්‍රස්ථාරය පෙරදිග ක්‍රමයට ලියා දක්වන්න. (ල. 06)

04) i. ශ්‍රී ලංකාවේ නූර්ති නාට්‍ය නිෂ්පාදකයින් දෙදෙනකු නම් කරන්න. (ල. 02)
ii. නිර්දේශිත නූර්ති හෝ නාඩගම් ගීයක මුල් කොටස ලියන්න. (ල. 04)
iii. නූර්ති හා නාඩගම් රංග සම්ප්‍රදායන්ට ආභාසය ලත් සංගීත සම්ප්‍රදායන් දෙක නම් කරන්න. (ල.02)
iv. නූර්ති හා නාඩගම් සඳහා යොදාගන්නා තාල වාද්‍ය භාණ්ඩ දෙක පිළිවෙලින් ලියන්න. (ල. 02)

05) i. භජන් ගීත ශෛලියේ සහ රවීන්ද්‍ර ගීත ශෛලියේ විශේෂ ලක්ෂණ දෙක බැගින් ලියන්න. (ල.04)
ii. භජන් ගීතයක හෝ රවීන්ද්‍ර ගීතයක ස්ථායි කොටස ලියන්න. (ල.04)
iii. ඔබ දන්නා නව නාට්‍ය දෙකක් නම් කරන්න. (ල. 02)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com